## 93 – සමිඳුනි ඔබ මට

සමිඳුනි ඔබ මට වාසනා නිතරම ගෙන එනවා
ඔබගේ සෙනෙහේ මා වෙනුවෙන් සැමදා ඉතිරී යනවා

ඔබ මගේ අත අල්ලාගෙන ආදර තාත්තා ලෙස මාගේ
උතුරා යන සෙනෙහසකින් මා නිතරම සුරකින්නේ

සතුරන් මට විත කරන්නට තැනුවත් නැහැ මම බය වන්නේ
ඔබ මා නපුරෙන් සුරකිනවා නොසැලන පවුරක් සේ

ජල මැද ගිනි මැද යන්නට වුවත් නැහැ මම බය වන්නේ
කොහේ සිටියත් මගේ නම කියලා ඔබ මා අමතන්නේ

ඉර හඳ නිවුණත් අඳුරු වුවත් ලොව කුමටද පැකිලෙන්නේ
ඔබමය අඳුරට ආලෝකේ පහන් ටැඹක් වාගේ